**පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජූලි 24 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**----------------------------------------**

**1.3.1 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**--------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**----------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.37,761,975 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,903,425 ක් වී තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.27,851,933 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.2,399,143 ක් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් විය.**

**1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------------**

**ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10 ඡේදයට අනුව, සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා නොගෙන, සති අන්ත හා රජයේ නිවාඩු දින 09 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.30,349 ක මුදලක් මාණ්ඩලික හා ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ගෙවා තිබුණි.**

**2.** මූල්‍ය සමාලෝචනය
------------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,560,300 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,468,766 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.908,466 ක පිරිහීමක් දක්නට ලැබුණි.

**2.2** විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.

--------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමග සැසඳීමේ දි, රු.908,466 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ වෙනත් ආදායම් සියයට 19 කින් හා බලපත්‍ර ගාස්තු සියයට 15 කින් අඩුවීම සහ වියදම් විෂයයන් 05 ක සියයට 46 ක් දක්වා වූ පරාසයක වියදම් වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පොළී ගෙවීම ලාභාංශ හා ප්‍රසාද මුදල් ගෙවීම රු.1,588,954 කින් වැඩි වී තිබුණි. සභා ගොඩනැගිල්ල ඉදි කිරීම වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය පියවීම ආරම්භ කිරීම මෙයට හේතු වී තිබුණි.

**2.3** කාරක ප්‍රාග්ධන කළමනාකරණය.
-------------------------------------

මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 1.4:1 වූ අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වූ 1.9:1 ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය වූයෙන්, සමස්ත ජංගම වත්කම්වලින් 86% ක් හෙවත්, මිලියන 37 ක් කර්මාන්ත

හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් **93%** ක් හෙවත්, මිලියන **27** ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.

**2.4** ආදායම් පරිපාලනය

----------------------

**2.4.1** වරිපනම් බදු

--------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.**268,211** ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.**531,644** ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය **60%** ක් පමණ වූ අතර, **2013** දෙසැම්බර් **31** දිනට අය වියයුතු රු.**342,883** ක ශේෂය සම්බන්ධයෙන් **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **158(1)** හා **159(1)** වගන්ති ප්‍රකාර **2014** මැයි **31** දින දක්වා අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4.2** බදු කුළී.

------------

**2013** දෙසැම්බර් **31** දිනට අය වියයුතු බදු කුළිය රු.**31,260** ක් අය කර ගැනීමට නීතිමය කටයුතු සිදු කර නොතිබුණි.

**2.4.3** ජල ගාස්තු.

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.**1,901,381** ක හිගයක් පැවති අතර, වර්ෂය අවසානයේ හිගය රු.**1,264,259** ක් විය. හිගයෙන් අයවීම **33%** ක තරම් දුර්වල මට්ටමක පැවතුණු නමුත්, එම මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් සභාව ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.4.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

---------------------------------

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,900,000 ක් හා මුද්දර ගාස්තු රු.7,000,000 ක් ලැබියයුතුව පැවතුණි.**

**3** **මෙහෙයුම් සමාලෝචනය.**

--------------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

-----------------------------------

**2012 වර්ෂයේ දි පාරිභෝගිකයින් 10 දෙනෙකු විසින් ජල සැපයුම් ලබා ගැනීම සදහා රු.37,000 ක මුදලක් සභාවට ගෙවා තිබු අතර, 2014 වර්ෂය දක්වාම එම සැපයුම් ලබා නොදි අදාළ මුදල් ආදායමට ගෙන තිබුණි.**

**3.2** **ව්‍යාපෘති ප්‍රමාදය.**

----------------------

**සභා අරමුදලින් නිම කිරීමට යෝජිත 2012 වර්ෂයට අදාළ රු.230,750 ක් වටිනා කර්මාන්ත/ ව්‍යාපෘති 09 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාළ රු.466,823 ක් වටිනා කර්මාන්ත ව්‍යාපෘති 12 ක් 2014 මැයි දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.**

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

----------------------------------------

**අයවැය පාලනය.**

--------------------

**සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය ලේඛනය හා වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැසදීමේ දි, විෂයයන් 04 ක සියයට 26 සිට සියයට 50 ක් දක්වා පරාසයකින් යුක්ත විචලනයන් නිරීක්ෂණය විය.**

**5.** **පද්ධති හා පාලන**

**---------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **අයවැය පාලනය**

**(ආ)** **වත්කම් කළමනාකරණය**

**(ඇ)** **ව්‍යාපෘති කළමනාකරණය**